

# අනායාගේ නරක පුරුද්ද

හසලි ඔලීනා හුලංගමුව

# අනායාගේ නරක පුරුද්ද

## හසලි ඔලීනා හුලංගමුව

කතෘ

පළමු දිගහැරීම

මහාමායා බාලිකා විදුහල

**3 - A**

**2026. 05. 10**

**ISBN : 978-624-211-005-9**

# පිදුම

මා හට අකුරු කරවන්නටත්,මා නිදියන තුරු සිය ගණන්
කතන්දර පවසමින් මා නිදි කළ
මගේ ආදරණීය අම්මාට සහ අප්පච්චිටත් ,

මා සමඟ සෙල්ලම් කරන
මගේ ආදරණීය නංගිට සහ මල්ලිටත් ,

මා හට අලුත් දේ ඉගෙන ගැනීමට උදවු කළ මහාමායා බාලිකා විද්‍යාලයේ
මගේ ආදරණීය විදුහල්පතිනියට සහ පන්ති භාර ගුරුතුමියටත් ,

මා හට බෙහෙවින් ආදරය කරන
මගේ පවුලේ සැමට සහ යහළුවන්ටත්

ආදරයෙන් පිරිනමමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

අනායා පොඩි ගැහැණු ළමයෙක්. එයාගෙ නරක පුරුද්දක් තිබුණා. ඒ මොකක් කියලද ඔයාලා හිතන්නේ?

එයා නියපොතු හපනවා? නෑ නෑ . ඒක නෙමේ.

එයා අනික් අයට ගහනවා? නෑ. ඒකත් නෙමේ.

එයාගෙ නරක පුරුද්ද තමයි අනික් අයට විරිත්තන එක. අනායාගේ අම්මා හැමවෙලේම අනායාගේ මේ නරක පුරුද්දට බනිනවා.

" ඔයා දවසක කාගෙන් හරි හොඳ පාඩමක් ඉගෙන ගනී " අනායාගේ අම්මා කිව්වා.





එක දවසක් අනායා සෙල්ලම් කර කර ඉද්දි එහා ගෙදර පොඩි පිරිමි ළමයා ආවා.
"මාත් ඔයත් එක්ක සෙල්ලම් කරන්නද?" එයා ඇහුවා. අනායා එයාටත් විරිත්තන්න පටන් ගත්තා.

ඒක දැකපු පොඩි පිරිමි ළමයා භය වෙලා අඩාගෙන දුවගෙන ගියා. අනායා දන්නේ නැති වුණාට මේ ඔක්කොම දිහා බලාගෙන හිටපු කෙනෙක් හිටියා.
නෑ නෑ. ඒ අනායාගේ අම්මා නෙමේ.
මේ වෙන කෙනෙක්.




ඒ තමා පුංචි සුරගංනාවියක්.
මේ සුරගංනාවිය අනායාගේ මේ නරක පුරුද්දට පොඩ්ඩක්වත් කැමැති වුණේ නැහැ.

" මම අනායාට හොඳ පාඩමක් උගන්වනවා" සුරංගනාවිය හිතුවා.

අනායා රෑ නිදාගෙන ඉන්න කොට, සුරංගනාවිය මන්තරයක් කිව්වා.

"මාගේ බලයෙන් අනායාට ඇගේ මුහුණෙන් විරිත්තන මුහුණක් හැර වෙනත් හැඟීම් පෙන්වීමට නොහැකි වේවා!! "



අනායා සුපුරුදු විදිහට උදෙන්ම නැගිට්ටා. එයා මුහුණ හෝදගෙන ඇඳුම් මාරු කරගෙන කුස්සියට ගියේ හොඳ සුවඳක් ආව නිසා.
අනායාගේ අම්මා අනායාගේ ආසම කෑම හදලා. කිරිබත්!.
"අද මම ඔයාගෙ ආසම කෑම හැදුවා"
අනායාගේ අම්මා කිව්වා.

අනායාට හරිම සතුටුයි. හැබයි අනායාට අමුත්තක් දැනුනා. එයා කොච්චර හිනා වෙන්න උත්සාහ කරත් එයාට හිනා වෙන්න බැරි වුණා.
"ඇයි විරිත්තන්නේ?" අනායාගේ අම්මා ඇහුවා.



"නෑ. මම විරිත්තන්නේ නෑ. මම කිරිබත් වලට ආසයි". අනායා කිව්වා.

"බොරු කියන්න එපා. ඔයා විරිත්තනව කියන්නේ ඔයා ඒකට කැමති නෑ!". අනායාගේ අම්මා දුකින් කිව්වා. අනායාටත් ගොඩක් දුක හිතුනා. ඒත් විරිත්තන එක නතර කරගන්න එයාට බැරි වුණා.

එයා කන්නෙත් නැතුව මිදුලට ගියා. මිදුලේ හිටියා එයාගෙ චූටි පූස් පැටියා.

"බෙලා.. බෙලා .. " අනායා චූටි පූස් පැටියට කතා කරා. ඒත් බෙලා දැක්කේ විරිත්තගෙන එන අනායාව.


පූස් පැටියා භය වෙලා ඈතට දුවගෙන ගියා.



පූසා පැටියා ඈතට යන හැටි අනායා දුකින් බලාගෙන හිටියා. අනායාට හිතාගන්න බෑ එයාගෙ මූණට මොකද වෙලා තියෙන්නෙ කියලා.

අනායා එයාගෙ ප්‍රශ්නෙ ගැන හිත හිත ඉද්දි ඈතින් එහා ගෙදර පොඩි පිරිමි ළමයා එනවා දැක්කා. ටික වෙලාවකින් එයා අනායා ළඟට ඇවිත් මෙහෙම කිව්වා.


" අනායා අද මගේ උපන් දිනේ. අපේ ගෙදර හවසට කේක් කපනවා. තව පැණි රස කෑම ජාති ගොඩක් තියෙනවා. ඔයා හවස මගේ ගෙදර එනවද?" පිරිමි ළමයා ඇහුවා.



අනායාට හරිම සතුටුයි. එයා හරි කැමතියි කේක් වලට. අනික ඒක උපන්දින සාදයක් නිසා, ගොඩක් ළමයි ඇවිත් ඉදියි. අනායාට ගොඩක් සෙල්ලම් කරන්න පුළුවන්.

අනායාට කියන්න ඕනි වුණේ සතුටින් ඔව් මම එනවා කියලා කියන්න. ඒත් කොච්චර උත්සහ කරත් එයාට හිනා වෙන්න බැරි වුණා. ඒ වෙනුවට අනායාට විරිත්තුනා.

" මගේ උපන්දින සාදයට නපුරු ඔයා එන්න එපා!" පිරිමි ළමයා තරහෙන් ගෙදර ගියා.



අනායාට හරිම දුකයි. එයාට අඩන්න ඕනි වුණත් විරිත්තන එක හැර වෙනත් කිසිම හැඟීමක් මුහුණෙන් පෙන්නන්න බැරි වුණා.
අනාය හොඳටම බයත් වුණා.
ආය කවදාවත් මට හිනා වෙන්න බැරි වෙයි. මම හැමවෙලේම අනික අයට විරිත්තන නිසා මගේ මූණට මෙහෙම වෙන්න ඇති. මේ ඔක්කොම මගෙ නරක පුරුද්දක නිසා වෙන්න ඇති. අනායා ගොඩක් දුකින් නින්දට ගියා.

මේ ඔක්කොම පුංචි සුරංගනාවිය බලන් හිටියා. අනායා හොඳ පාඩමක් ඉගෙන ගත්තා. සුරංගනාවිය හිතුවා.



සුරංගනාවිය ආයිමත් මන්තරයක් කිව්වා.
"මාගේ බලයෙන් අනායාගේ මුහුණ ආයිමත් යථා තත්වයට පත් වේවා!! ".

පහුවදා උදෙන්ම අනායා නැගිට්ටා. අනායාට එයාගෙ අම්මා අලුත් බෝනික්කෙක් ගෙනැත් තියෙනවා අනායා දැක්කා.

" ස්තූතියි අම්මා " අනායා කිව්වා.
"හරිම ලස්සනයි නේ ඔයාගෙ හිනාව" අනායාගේ අම්මා කිව්වා.
අනායා දුවගෙන කණ්නාඩිය ඉස්සරහට ගියා.



එයා දැක්කා එයාට ආයෙත් හිනා වෙන්න පුළුවන් කියලා. අනායාට හරිම සතුටුයි. එයා ආය කවදාවත් විරිත්තුවේ නෑ. එයා හැමදාම හිනා වෙලා හිටියා.

කොච්චර එයා හිනා වුණාද කියනවානම් එයාට හැමෝම නමක් දැම්මා " **හිනා වෙන අනායා**" කියලා.



**නිමි.**



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN : 978-624-211-005-9